මගේ අංකය සිඑස්ඩී/1/12/11 චක්‍රලේඛ අංක 04/2016

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23, දුම්රියපළ පාර,
බම්බලපිටිය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
සියළුම අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන්
මූලස්ථාන මාණ්ඩලික නිලධාරි
සියළුම බළකා අණදෙන නිලධාරීන්/පුහුණු පාසල් අණදෙන නිලධාරීන් 2016.05.07

## අපරාධමය ක්‍රියාවන්හි නියැලෙන සිවිල් ආරක්ෂක පුද්ගලයින්ට එරෙහිව කටයුතු කිරීම

පසුගිය කාලය තුලදී සිවිල් ආරක්ෂක පුද්ගලයින් නොයෙකුත් අපරාධමය ක්‍රියාවන්හි නියැලෙමින් විනය කඩු කරන අවස්ථාවන්හි වැඩි වර්ධනයක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය වී ඇත. මෙවැනි ක්‍රියාවන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, සිවිල් සාමාජයෙහි අප කීර්තියට ලක්වීමට හේතු විය හැක.

සියළුම සිවිල් ආරක්ෂක පුද්ගලයින් රටේ බලපවත්නා සියළුම නීතීන්ට යටත්වේ. යම් සිවිල් ආරක්ෂක පුද්ගලයෙකු අපරාධමය ක්‍රියාවක නියැලෙන අවස්ථාවකදී ඔහු රටේ ක්‍රියාත්මක වන සිවිල් අපරාධ අධිකරණයන්හි අධිකරණ බලයට සහ අදාල නීතිමය ප්‍රතිපාදනයට යටත් වේ.

මෙසේ සිවිල් ආරක්ෂක පුද්ගලයින් අපරාධ ක්‍රියාවන්හි යෙදීම මගින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අපකීර්තියට පත්වීම සහ එමගින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, සිවිල් පුද්ගලයින් අතර අප්‍රසාදයට පත්වීම වළක්වා ගැනීමේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කීර්තිනාමය වැඩි වර්ධනය කර ගැනීමේ පියවරක් වශයෙන් අපරාධමය ක්‍රියාවන්හි නියැලෙන පුද්ගලයින්ට එරෙහිව තරයේ නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

යම්කිසි සිවිල් ආරක්ෂක පුද්ගලයෙකු විසින් අපරාධමය වරදක් කරනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ අණදෙන නිලධාරි විසින් ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් සකසා ඔහුගේ නිර්දේශයන්ද සමඟ නිසි කටයුතු සඳහා දින 3ක් ඇතුලතදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුවේ.

තවද, සියළුම අණදෙන නිලධාරීන් විසින් තමන් යටතේ සිටින සියළුම නිලධාරීන් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින් මෙම සංදේශයේ අඩංගු කරුණු පිළිබඳව දැනුවත් කළ යුතු වන අතර, සියළුම අණදෙන නිලධාරීන් මෙම සංදේශය ප්‍රකාරව කටයුතු කරනු ලබන බවට වගබලා ගත යුතුවේ.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව